# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (දෑ අවුරුදු) 2017/2019 සහ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (එක් අවුරුදු) 2017/2018

## පළමු සෙමෙස්තරය

## MAS 612 සෞඛ්‍ය හා වෛද්‍ය සමාජ විද්‍යාව

**ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න**

**කාලය : පැ තුනයි (03)**

---

1. ජෛව වෛද්‍ය ප්‍රවේශයේ සීමාවන් හඳුනාගැනීම සඳහා සෞඛ්‍ය සහ රෝගීත්වය පිළිබඳ සමාජ ප්‍රවේශයේ වැදගත්කම විවේචනාත්මකව විභාග කරන්න.

2. 'ජෛව වෛද්‍යවිද්‍යාව සමාජ අසමානතාව ප්‍රතිෂ්ඨම්භනය කරයි.' දේශපාලන ආර්ථික පර්යාලෝකය කෙරෙහි විශේෂ අවධානය සහිතව මෙම ප්‍රකාශය විවේචනාත්මකව විභාග කරන්න.

3. ශ්‍රී ලාංකේය සමාජය කෙරෙහි විශේෂ අවධානය සහිතව සෞඛ්‍ය සංරක්ෂණයේ ජනප්‍රිය (popular folk) ජන හා වෘත්තීමය (professionnal) අංශවල විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

4. ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ සෞඛ්‍ය උවදුරක් බවට පත්ව ඇති හේතු කාරක මූලය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය ආශ්‍රිතව පැන නැගෙමින් පවත්නා සමාජ ගැටලු මොනවාදැයි සාකච්ඡා කරන්න.

5. HIV / AIDS නිවාරණය සම්බන්ධයෙන් දියුණු වෙමින් පවත්නා රටවල් මුහුණ පා ඇති සමාජ අභියෝග මොනවාදැයි විභාග කරන්න.

6. වත්මන් ශ්‍රී ලාංකේය සමාජයේ රාජ්‍ය - පෞද්ගලික මිශ්‍ර සෞඛ්‍ය සේවා බෙදා හැරීමේ ක්‍රමයෙහි පවත්නා වාසි අවාසි විභාග කරන්න.

7. වත්මන් සමාජය තුළ පුද්ගලයන්ගේ එදිනෙදා ජීවිතයේ සමාජ හා ස්වභාවික සිදුවීම් වෛද්‍යකරණයට නතු වී ඇති ආකාරය නිදසුන් සහිතව විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

8. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම **<u>දෙකක් (02)</u>** පිළබඳ කෙටි රචනා ලියන්න.

   (i) රෝගී භූමිකාව (Sick role)
   (ii) මානව වංශ වෛද්‍යවිද්‍යාව (Ethno-medicine)
   (iii) සෞඛ්‍ය හා සම්බන්ධ සමාජ නිශ්චායක (Social determinants of health)
   (iv) මානසික රෝගිත්වය හා බැඳි සමාජ කැළල (Social stigma attached to mental illness)

***************

# UNIVERSITY OF COLOMBO – SRI LANKA

## FACULTY OF ARTS

### Examination in Master of Arts in Sociology (Two years) – 2017/2019 & Masters in Sociology (One year) – 2017/2018

**Semester I**

**MAS 612 – Sociology of Health and Medicine**

**Answer four (04) questions only**

***Time : Three (03) hours only***

---

1. Critically examine the importance of the social approach to health and illness in identifying the limitations of the biomedical approach.

2. 'Biomedicine reinforces social inequality.' Critically examine this statement with special attention to the political economy perspective.

3. Explain specific characteristics of popular, folk and professional sectors of healthcare with special reference to Sri Lankan society.

4. Discuss the emerging social issues related to Chronic Kidney Disease with unknown etiology that have become a health hazard in the Dry Zone of Sri Lanka.

6. Examine the social challenges faced by developing countries in HIV/AIDS prevention.

7. Critically discuss with examples how social and natural events of everyday life of people have become medicalized in contemporary society.

8. Write short essays on any **two (02)** of the following topics.

   (i) Sick role
   (ii) Ethno-medicine
   (iii) Social determinants of health
   (iv) Social stigma attached to mental Illness

****************